වලිකාමම් බටහිර ප්‍රාදේශිය සභාව
යාපනය දිස්ත්‍රික්කය

------------------------------------------------

1. මුල්‍ය ප්‍රකාශ

---------------

1.1 මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 20 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 නොවැම්බර් 30 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මුල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට වලිකාමම් බටහිර ප්‍රාදේශිය සභාවේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මුල්‍ය ප්‍රකාශ පිළිබඳව අදහස් දැක්විම

--------------------------------------------

1.3.1 ගිණුම්කරණ ඌනතා

-----------------------------

(අ) ගිණුම් ප්‍රකාශ වල නිරික්ෂණය වූ ඌනතා ආදායම්, වත්කම් සහ බැරකම් වශයෙන් පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මුල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම් | ආදායම් | | වත්කම් | | බැරකම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| අඩුවෙන් දැක්විම් | - | - | 02 | 25,500 | - | - |
| වැඩියෙන් දැක්විම් | 01 | 83,970 | 01 | 1,311,850 | 04 | 13,301,672 |

(ආ) සභාව විසින් භාවිතා කළ වාහන හතක වටිනාකම තක්සේරු කර ගිණුම් වලට නොගැනීම නිසා ගිණුම් වල වාහන වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳු ගිණුම්

----------------------

ප්‍රධාන ලෙජරයේ රු.1,263,700 ක් වශයෙන් දැක්වුණු දේශිය සංවර්ධන ණය පොලිය, අවසාන ගිණුම් වල රු.1,677,752 ක් ලෙස දක්වා තිබුණි.

1.3.3 අනුකුල නොවීම්

----------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම් විගණනයේ දි නිරික්ෂණය විය.

| නීති, රීති,රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති | | |
| පරිච්ඡේදය 111 වගන්තිය 66 | - | රු.5,668,174 ක් වු වරිපනම් හා බදු , බදුකුලී සහ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනිම සඳහා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| අංක 57 | - | 2001-2011 කාල පරිච්ඡේදය සඳහා වු කල් ඉකුත් වු තැන්පතු රු.852,141 ක් ආදායමට බැර කිරිම සඳහා කටයුතු කර නොතිබුණි. |

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිකම

---------------------------------------------

අවශ්‍ය තොරතුරු ලබා නොදිම නිසා රු.4,138,742 ක් සඳහා වු ගණුදෙණු විගණනයේදි සන්නිරික්ෂණය කළ නොහැකි විය.

2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---------------------------------------

2.1 මුල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ වලට අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායමක් නොවු අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදහ ඉක්ම වු ආදායම රු.16,476,671 ක් විය.

2.2 මුල්‍ය පාලනය
------------------

අයවැය විධිමත් පරිදි පිළියෙල නොකිරීම නිසා අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර රු.8,990,069 ක වෙනසක් ද , අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර රු.3,173,507 වෙනසක් ද විගණනයේදී නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය
--------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම
-----------------------------------------------------------------

සභාපති විසින් ඉදිරිපත් කරන ලද පරිදි, ඇස්තමේන්තුගත ආදායම තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දින සමුච්චිත හිඟ ආදායම |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 1,858 | 1,823 | 5,390 |
| (ii) බදු කුලී | 9,592 | 9,888 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,288 | 1,768 | - |
| (iv) වෙනත් ආදායම් | 38,560 | 46,809 | 37,757 |

2.3.2 උසාවි දඩ මුදල්
--------------------

අගෝස්තු සිට දෙසැම්බර් 2013 කාල පරිච්ඡේදය සඳහා මහේස්ත්‍රාත් උසාවියෙන් ලැබිය යුතු රු.502,102 ක් වූ උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂය තුලදී ලබාගෙන නොතිබුණි.

2.3.3 මුද්දර ගාස්තු
-----------------

I. රු.32,867,361 ක් වූ 2006-2012 වර්ෂ සඳහා වූ මුද්දර ගාස්තු ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. එනමුත් එම මුදල් අයකරගෙන නොතිබුණි.
II. සමාලෝචිත වර්ෂය සඳහා රු.15,454,635 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතු මුදල් සහ ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. එනමුත් එම වාර්තාවේ දින දක්වාම එම මුදල් අයකර ගැනීම සඳහා ඵලදායි ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.4 වරිපනම් හා බදු හිඟ මුදල්
---------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව දේපල තහනම් කිරීමේ නියෝග නිකුත් කිරීම මගින් රු.5,390,169 ක් වූ වරිපනම් හා බදු හිඟ මුදල් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී කටයුතු කර නොතිබුණි.

2.4 වත්කම් කළමනාකරණය
-------------------------------

2.4.1 අක්‍රිය වාහන
-----------------

සභාවට අයත් අංක 252-6540 දරන පික්අප් රථය පසුගිය වර්ෂ 10 තුල සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

වැසිකිලි සහ ප්‍රජා මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා 2010-2012 වර්ෂ තැල වෙන්කර තිබූ රු.186,846 ක් වැයකර නොතිබුණි. මෙම මුදල මිශ්‍ර තැන්පතු ගිණුමෙහි ඇතුලත් කර තිබුණි. මේ හේතුවෙන් ජනතාවට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වී තිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

2.6.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

--------------------------------------------

රු.3,889,308 ක් වටිනාකමැති ව්‍යාපෘති 10 ක් සමාලෝචිත වර්ෂය කෙළවර වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. මේවා විවිධ ණයගැති ගිණුමේ ඇත්ලත් කර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කිරීමෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් පෙන්නුම් කෙරිණි.

2.6.2 ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය මගින් මුදල් වෙන්කළ රු.4,405,000 ක වටිනාකමැති ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.6.3 අනුමත නොකළ ව්‍යාපෘති

-------------------------------

රු.640,016 ක් වටිනාකමැති ව්‍යාපෘති තුනක් සහා අරමුදල් භාවිතා කර ක්‍රියාත්මක කර තිබුණි. මේවා අයවැය මගින් අනුමත කර නොතිබුණි.

| කාර්ය විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| ජලය රැස්කිරීම සඳහා ඉඩම් මැනීම | 18,000 |
| ආරුමුගම් විද්‍යාල පාර, චුලිපුරම් | 396,986 |
| සිවන් කොවිල පාර | 225,030 |
| | 640,016 |

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ

(අ) අයවැය
(ආ) ආදායම් එකතු කිරීම
(ඇ) වාහන උපයෝජනය
(ඈ) විවිධ තැන්පතු
(ඉ) මිශ්‍ර තැන්පතු
(ඊ) අත්තිකාරම්